උතුරු මැද පළාත් සභාව 2024 වර්ෂය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු මැද පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට උතුරුමැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024 දෙසැම්බර් 31 දිනැති 2024/16 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.1 වගන්තිය ප්‍රකාරව PTRBK වැඩසටහන මඟින් උත්පාදනය වන විස්තීර්ණ ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 20 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන 10 ක් සමඟ විස්තීර්ණ ශේෂ පිරික්ෂුම ඉදිරිපත් කර ඇත.	භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුයි.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ජංගම නොවන වත්කම් වර්ග 08 ක වටිනාකම හා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් අතර රු.3,469,072,942ක වෙනසක් පැවතුණු අතර රු.18,810,045,165 ක් වටිනා ජංගම නොවන වත්කම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරියේදී මෙම දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කෙරේ.	වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතු අතර, සියළුම වත්කම්, වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුළත් කළ යුතුයි.

(ඇ)	පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය මගින් උතුරු මැද පළාත් සභාව සඳහා 2024 දෙසැම්බර් 26 දින නිදහස් කර තිබූ රු.50,487,805 ක් අක් මුදල් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	මෙම මුදල 2024 වර්ෂයේදී වියදම් දරන ලදි. 2025 වර්ෂයේදී ගිණුම් ගත කර ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුවීම වලක්වා ගනිමි	සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි.
(ඇ)	පළාත් සභාව වෙත වටිනාකම රුපියල් මිලියන 1,848.4 ක් වූ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලැබී තිබුණු අතර, එම අක්මුදල් නිදහස් කිරීමේ ලේඛනය අනුව වටිනාකම රුපියල් මිලියන 1,900.4 ක් වීමෙන් රුපියල් මිලියන 52 ක වෙනසක් පැවතුණි.	මහා භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ප්‍රමාණයට අමතරව පළාත් සභා අරමුදල්ද නිදහස්කර ඇති බැවින් මෙම වෙනස ඇති වී ඇත.	අක් මුදල් නිදහස් කිරීමේ ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුයි.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1 .5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 600 - ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වන අලි මිනිස් ගැටලුව විසඳීම පිළිබඳ යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ පළාත් සභාව හරහා උතුරු මැද පළාතේ අලි වැට ආරක්ෂා කිරීමට මුර කුටි 81 ක් ඉදිකිරීම සඳහා රු.32,400,000 ක වියදමක් දැරුව ද එම කාර්යය කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම මත අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකි වී තිබුණි. ඒ පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීමට හා කලින් කළ තත්ත්වයක් සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබීම මත එකී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු ජීවිත හානි, වගා හානි සිදු වී තිබුණි.	ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු පළාත් කෘෂිකර්ම ලේකම් වෙත පවරා ඇත.	අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද යන්න පසු විපරම් කළ යුතුයි.

(ආ)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1, 2.2, 2.3, 2.4, 2.5 ඡේද අනුව පළාත් සහා ප්‍රතිපාදන මගින් ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලය හරහා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් සමිතියකට කොන්ත්‍රාත් 05 බැගින් එකවර පිරිනමා තිබුණු අතර මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බල ප්‍රදේශයේ නොමැති ගොවි සංවිධානයක් වෙත කොන්ත්‍රාත් 10 ක් එකවර පිරිනමා ඉදිකිරීම් කාර්යයන් ඉටු කිරිම මගින් ඉදිකිරීම් අධීක්ෂණය හා ඉදිකිරීම්වල ගුණාත්මක තත්ත්වය පිළිබඳව ගැටළු ඇති වී තිබුණි.	අදාල ප්‍රාදේශීය ලේකම් වෙත මෙම විමසුම යොමුවිය යුතු බව.	නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) මගින් ඉදි කිරීම් අධීක්ෂණයට යටත්ව කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කළ යුතුයි. එසේම ප්‍රජා පාදක සංවිධානයක් වෙත කොන්ත්‍රාත්තු 03 කට වඩා එකවර ලබා නොදිය යුතු අතර, පළාත් සභා අරමුදල් වන බැවින් චක්‍රලේඛ ප්‍රකාරව කාර්යයන් ඉටු කරවා ගත යුතුය.

1.5.2 ශීර්ෂය 602 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරු 21 ක් සඳහා වාර්ෂිකව දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවත්, 2024 වර්ෂයේදී එක් වරක් පමණක් විභාග පවත්වා තිබුණි. 2024 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගැනිමට අපේක්ෂා කරන ලද කාර්යක්ෂමතා කඩයිම් විභාග 03 ක් පවත්වා නොතිබුණි.	කාර්යක්ෂමතා කඩඉම් විභාග 2024 වර්ෂය සඳහා එක් වරක් පමණක් පැවැත්වීමට සිදුවිය.	නියමිත කාලයන් තුළදී කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට කටයුතු කළ යුතුයි.

(ආ)	උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017 සැප්තැම්බර් 25 දින පත්වීම් ලබාදෙන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 I(ආ) ශ්‍රේණියට ලබාදුන් ගුරු පත්වීම් අතරින් ගුරු පත්වීම් 02 ක් සඳහා අදාළ සම්මුඛ පරීක්ෂාවේදී සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්කරුවන් දෙදෙනෙකුට පත්වීම් ලබාදී තිබීම සම්බන්ධයෙන් විමර්ශනය කර විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මූලික විමර්ශන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි.	සුදුසුකම් ලබා නොමැති අයට පත්වීම් ලබාදුන් නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුයි.
(ඇ)	අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් 05 ක සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටි පරිවාස කාලය දීර්ඝ කර නොතිබූ එහෙත් විවිධ හේතූන් මත පරිවාස කාලයේ දී සේවය අවසන් කිරීමට හැකියාව තිබූ නිලධාරීන් 07 දෙනෙකුගේ සේවය අවසන් කිරීම සඳහා වසර 08 ත් 25 ත් අතර කාලයක් ගතවී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සේවය ස්ථිර කිරීමට පෙර පරිවාස කාලය තුළදී නිලධාරීන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කළ යුතුයි.

1.5.3 **ශීර්ෂය 610 - ප්‍රධාන අමාත්‍ය හා උතුරුමැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතලපහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2021 වර්ෂයට පෙර කාලයේ අත්සන් කරන ලද ගිවිසුමක් අනුව නාගරික මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක වැඩ ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එම ආයතනයට අත්තිකාරම් සුරක්ෂණයකින් තොරව ලබාදෙන ලද රු.128,316,501 ක් වූ අත්තිකාරම් මුදලක් අයකර ගැනීමට වසර ගණනක් තුළ කටයුතු කර නොතිබුණු අතර, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයෙහි හෙළිදරව් ද කර නොතිබුණි.	අත්තිකාරම් වැය විෂයට හර කොට වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොමැත.	වගකීම පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය

1.5.4 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	වෙළඳපොළ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් හෝ පළාත් සභාවේ මුදල් උපදේශන කමිටුවේ අනුමැතියකින් තොරව ආරම්භ කර තිබුණු පාසල් පොත් අළෙවි අංශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.2,411,352 ක අලාභයක් සිදු වී තිබුණි.	වෙළඳපොළ පිළිබද ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නව ව්‍යාපෘති ආරම්භ කිරිමට කටයුතු යොදා ඇත.	විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘතිය ආරම්භ කිරීම යෝග්‍ය බව තහවුරු කර ගැනීමෙන් තොරව ව්‍යාපෘති ආරම්භ නොකළ යුතුයි.
(ආ)	ආයතනයේ උප ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යනු ලබන පළාත් ආරක්ෂක ඒකකය, ආරක්ෂක අමාත්‍යාංශයේ පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කර නොතිබුණි.	සති දෙකක් ඇතුලත ලියාපදිංචි සහතිකය ලබා ගත හැකි බව ආරක්ෂක අමාත්‍යාංශය විසින් වාචිකව පවසන ලදී.	ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වීමට කටයුතු කළ යුතුයි.
(ඇ)	මුද්‍රණාලය සඳහා අවශ්‍ය කඩදාසි (60 GSM blank paper (24”x34”) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 ක දී රු.24,755,195 ක වටිනාකමකට මිලදී ගෙන තිබුණු අතර, ඒ එක් එක් අවස්ථාවේදී සැපයුම්කරු තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේ දී පරස්පර නිර්දේශ ලබා දී තිබුණ ද එම නිර්දේශ සැලකිල්ලට ගෙන නොතිබුණි.	මේ වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඈ)	යාන්ත්‍රික අංශය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.24,312,572 ක් වූ වාහන අමතර කොටස් සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගෙන තිබුණි.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි

1.5.5 මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	අධිකාරියේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ගොඩනැගිලි සැලැස්ම අනුමත කරගෙන නොතිබීම හේතුවෙන් අනුරාධපුර	මේ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් මාස 03 ක් ඇතුළත පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය කර ඇත.	අධිකාරියට සිදු වූ ඇති පාඩුව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

	මහනගර සභාව විසින් එම ඉදිකිරීම් අත්හිටුවා තිබුණු අතර 2020 ජනවාරි 29 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ තීරණය අනුව කොන්ත්‍රාත්කරු විසින් ප්‍රසම්පාදන අස්ථිත්වයට රු.3,812,085 ක් ගෙවිය යුතු බවට නිර්දේශ කර තිබුණ නමුත් එම මුදල අයකර ගැනීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කර නොතිබුණි.		
(ආ)	2013 නොවැම්බර් 14 දින සිට 2015 මාර්තු 19 දින දක්වා අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කළ තැනැත්තෙකු විසින් එම අධිකාරියේ පෙර පාසැල් ගුරුවරුන්ගේ 2014 ඔක්තෝබර් මාසයේ දීමනා මුදල වූ රු.900,000 ක් ලබාගෙන එය තම පෞද්ගලික පරිහරණය සඳහා ලබා ගැනීම හා අධිකාරියට අයත් වටිනාකම රු.285,250 ක් වූ උපකරණ තොගයක් අධිකාරියට භාර නොදීම සම්බන්ධයෙන් විධිමත් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදු කර අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ලිපි ලේඛන අධිකාරිය භාරයේ නොමැති බැවින් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදු කිරීමට හැකියාවක් නොමැති බව දක්වා ඇත.	පරීක්ෂණයක් සිදු කර අලාභය අයකර ගැනීමට කටයුතු සිදු කළ යුතුයි.

1.5.6 **පුස්තකාල සේවා මණ්ඩලය**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්**	**නිර්දේශය**
(අ)	2023 මාර්තු 08 වන දින පැවති උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ 33 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ මාණ්ඩලික පත්‍රිකා 164/2023 ට අනුව කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රාථමික පාසල් සම්බන්ධ කර ගනිමින් කියවීම් කඳවුරු පොළොන්නරු දිස්ත්‍රික්කයේ වැඩසටහන් 10 ක් සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණද, පොළොන්නරු දිස්ත්‍රික්කය සඳහා ක්‍රියාත්මක කර තිබුණේ වැඩසටහන් 05 ක් පමණි.	පැවති සම්පත් ප්‍රමාණවත් වූයේ කියවීම් කඳවුරු 05ක් පැවැත්වීම සඳහා පමණක් බව දන්වා ඇත.	පවතින සම්පත් අනුව ප්‍රායෝගිකව සිදු කළ හැකි වැඩසටහන් සැලසුම් සැකසිය යුතුයි.

(ආ)	ප්‍රඥප්තියේ 19 (ආ) වගන්තියේ සඳහන් පරිදි උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණයන්, උතුරු මැද පළාත් බල ප්‍රදේශයේ පුස්තකාල සහ විඥාපන සේවා සංවර්ධනයට යෙදවිය හැකි නමුත් සමාලෝචිත වර්ෂයේ අරමුදලෙන් ඒ සඳහා කිසිඳු ගෙවීමක් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රඥප්තියානුකාරව කාර්යන් ඉටුකරන ලෙස කළමනාකරණ අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇත.	ප්‍රඥප්ති ප්‍රකාරව පවතින අරමුදල් අරමුණු ඉටු කර ගැනීමට ඵලදායි ලෙස යෙදිය යුතුයි.
(ඇ)	උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට පියවර නොගෙන දීර්ඝ කාලයක සිට වසරින් වසර ස්ථාවර තැන්පතු අලුත් කරමින් පොලිය ද සමඟ රු.2,860,000 ක මුදලක් ආයෝජනය කර තිබුණි.	එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන බව දන්වා ඇත.	අරමුදල පිහිටු වීමේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුයි.

1.5.7 **ශීර්ෂය 611 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සංවර්ධක සහයක ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 07 ක ඉදිකිරීම් ව්‍යාපෘති 07 කට අදාළව ගෙවීම් කිරීමේදී ව්‍යාපෘති 03 ක ඉටු නොකළ වැඩ ඒකක 27 ක් සඳහා රු.2,925,875 ක් වැඩිපුර ගෙවීම් කර තිබූ අතර ව්‍යාපෘති 06 කට අදාළව රු.31,172,946 ක මුදලක්, අතිරේඛ වැඩ වශයෙන් ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කර තිබුණි. තවද ව්‍යාපෘති 03 ක් සඳහා රු.15,938,324 ක මුදලක මිල විචලනයන් සඳහාද ගෙවා තිබුණු අතර, එම මිල විචලනය සියයට 21 සිට සියයට 35 ත් අතර ප්‍රතිශතයක් විය. එමෙන්ම රු.4,890,873 ක් වටිනා අයිතම 41 ක් සඳහා වගකීම් සහතික ඉදිරිපත් කර නොතිබිය දී ඊට අදාළ ගෙවීම් කර තිබුණි.	අතිරේක වැඩ, ඇස්තමේන්තු ප්‍රමාණ ඉක්මවීම සහ මිල විචලනයන් සඳහා ඉදිරියේදී අදාළ අනුමැතිය නිසි පරිදි ලබා ගන්නා බව දක්වා ඇත. අයිතමයන් 18 ක් සඳහා වගකීම සහතික ලැබී ඇත.	ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අතිරේක වැඩ හා ප්‍රමාණ ඉක්මවීම් අවම වන ලෙස පිළියෙල කළ යුතු අතර අදාළ වගකීම් සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	2024 වර්ෂයේ පදවිය ප්‍රාදේශීය සභාව සඳහා ගලි බවුසරයක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර මිල ගණන් කැඳවීම හේතුවෙන් නියමානුකූලව ප්‍රතිචාර දක්වා තිබූ හා	ලංසු ලියකියවිලිවල පැවති අඩුපාඩු හේතුවෙන් මෙම ලංසු කැඳවීම අවලංගු කර නැවත කැඳවිය යුතු බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව තීරණය කර	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශකරන ලද ලංසුකරු අනුමත නොකර ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත මිල ගණන් කැඳවීමට තීරණය කිරීම හේතුවෙන් ට්‍රැක්ටර් ගලි බව්සරය මිලදී ගැනීමේදී රු.240,000ක අලාභයක් සිදු වී තිබුණි.	ඇත.	

1.5.8 ශීර්ෂය 612 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අ/කැබිතිගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලයේ 90 x 25 දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් අවස්ථා 10 ක දී රු.6,453,413 ක වටිනාකමක් ගෙවීම් කර තිබුණද උතුරු මැද පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ රීති 164 හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.2 ප්‍රකාරව වැඩ අවසන් කිරීමේ විශේෂ සහතිකයක් මෙතෙක් ලබාගෙන නොතිබුණි.	දෙමහල් ගොඩනැගිල්ලේ නියමිත පිරිවිතරයන් හා කොන්දේසි වලට අනුකූලව සාදා නොමැති බව පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත දන්වන ලදි. ඉදිරියේදී මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා දීමට අපේක්ෂා කරන බව.	ඉදිකිරීම් වැඩ අවසන් නම් විශේෂ සහතිකය ලබා ගත යුතුයි. එසේ නොමැතිව අවසන් ගෙවීම් නොකළ යුතුයි.
(ආ)	උතුරු මැද පළාත් මූල්‍ය රීති සංග්‍රහය රීති 177 ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලයේ හා අ/කලුවිල සේන මහා විද්‍යාලයේ 2024 වර්ෂයේ පිළිවෙලින් රු.2,881,500 ක් සහ රු.2,322,846 ක් වටිනා වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.	වර්තමාන විදුහල්පති වෙත අදාළ ලිපි ලේඛන භාර දී නොමැති බැවින් පිළිතුරු ලබා දිය නොහැකි බව.	සෑම වවුචරයකට ගෙවීම් කිරීමේදී අදාළ වගකිවයුතු නිලධාරීන් විසින් සහතික කර ඇත්දැයි පරීක්ෂා කර බැලිය යුතුයි.
(ඇ)	උතුරු මැද පළාත් මූල්‍ය රීති සංග්‍රහය රීති189.3 ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව ආදර්ශ ප්‍රාථමික විදුහලේ 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.2,252,680 ක් වූ වටිනා වවුචර් 16 ක් විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	වවුචර්පත් 16 ක් විගණනයට ඉදිරිපත් කර නොමැති බව පැහැදිලි වේ.	ගෙවීම් වවුචර් විගණනය විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී ඉදිරිපත් කළ යුතුයි.
(ඈ)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1, 2.2, 2.3, 2.4, 2.5 ඡේද ප්‍රකාරව හිඟුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2024	2025 වර්ෂයේ කොන්ත්‍රාත් පැවරීමේදී චක්‍රලේඛයෙහි විධිවිධාන අනුගමනය කිරීමට කටයුතු කරන බව .	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

	වර්ෂයේදී ප්‍රජා පාදක සංවිධානවලට රු.45,056,867 ක කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර එයින් එක් සමිතියක පලපුරුද්ද මූල්‍යමය හැකියාව පිළිබඳ සලකා බැලීමෙන් තොරව රු.මිලියන 5 ක කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි.		
(ඉ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම අනුව පවරන ලද වැඩ සඳහා උප කොන්ත්‍රාත් ලබා නොදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.9,427,670 ක් වටිනා කොන්ත්‍රාත් 03 ක් පාසැල් සංවර්ධන සමිති 03 ක් විසින් උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.	සියලුම විදුහල්පතිවරුන්ට උප කොන්ත්‍රාත් ලබා නොදිය යුතු බව ලිඛිතව දන්වා යැවීමට කටයුතු කළ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඊ)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ ගණිත සම්පත් මධ්‍යස්ථානයේ වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමේදී, වෙළඳ පොළ මිල ගණන් පිළිබඳව අවධානය යොමු නොකිරීම නිසා සාමාන්‍ය වෙළඳපොළ මිලට වඩා රු.594,990 ක වැඩිපුර මිලක් ගෙවීම් සිදුකර තිබුණු අතර වැඩ විෂයයන් වෙනස් කිරීම නිසා රු.773,643 ක් වැඩිපුර ගෙවීමක්ද සිදු වී තිබුණි.	ඉන්වොයිසියේ සඳහන් මිල වෙළඳ පොළේ මිල සමඟ සන්සන්දනය කර ගෙවීම් කළ බවත් ඉදි කිරීම් ද්‍රව්‍ය මිල පදනම්කරගෙන රජයට අවාසිදායක නොවන පරිදි ගෙවීම් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන හා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(උ)	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කලාප 03 කට අදාළ පාසල් 495 ක වැසිකිළි පහසුකම් නොමැති අතර, පාසල් 1008 ක වැසිකිළි අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතී. එමෙන්ම පාසැල් 92 ක පානීය ජල අවශ්‍යතා ද සපුරාලිය යුතුව ඇති නමුත්, වසර ගණනාවක් එකී අවශ්‍යතා සපුරාලීමට කටයුතු කර නොතිබුණි.	පාසල්වල ජලනල පද්ධතියෙන් අලුත් වැඩියා කටයුතු ප්‍රධාන අමාත්‍යාංශය මඟින් සිදු කර ඇත.	පාසල් සඳහා පානීය ජලය ලබාදීම හා වැසිකිළි අලුත් වැඩියාව ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කළ යුතුයි.
(ඌ)	අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල අනුව සමස්ත දිවයිනේ පළාත් අතරින් අඛණ්ඩව 2021 සහ 2022 වර්ෂයේදී 9 වන ස්ථානය හිමි වී තිබුණු අතර, ජාතික මට්ටමේ සමත් සාමාන්‍ය ප්‍රතිශතයට වඩා උතුරු මැද පළාතේ සමත් ප්‍රතිශතය පහළ මට්ටමකද	විභාග ප්‍රතිඵල ඉහල නැංවීම සඳහා පළාත්,කලාප,හා පාසල් මට්ටමින් වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදි.	ප්‍රතිඵල ඉහළ නැංවීමට පාසල් මට්ටමින් සිසුන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ ප්‍රසස්ථ වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයි.

	පැවතුණි. නමුත් එම තත්ත්වයෙන් මිදීම සඳහා පළාතේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීමට පාසැල් මට්ටමින් ප්‍රශස්ත වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.		
(එ)	පළාතේ කලාප කාර්යාල 04 ක විදුහල්පති නිල නිවාස 116 ක්ද ගුරු නිවාස 500 ක් අලුත්වැඩියා තත්ත්වයේද දෙවර්ගයේම නිවාස 100 ක් ඉවත් කළ යුතු තත්ත්වයේද නිවාස 238 ක් ඌන උපයෝජිතව පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	නිල නිවාස අලුත්වැඩියා කිරීමටත් ඌන උපයෝජිත නිවාස භාවිතයට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.
(ඒ)	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වාහන 10 අතරින් වාහන 06 ක් ද, අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඇති යතුරු පැදි 04 ක් ද වර්ෂ ගණනාවක සිට ධාවනයෙන් ඉවත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	එම වාහන වල ලියාපදිංචි අයිතිකරුවන් වෙතින් ප්‍රධාන ලේකම් උතුරුමැද පළාත නමට පවරා ගැනීම ප්‍රමාද වූ නිසා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී ඇත.	තාක්ෂණික නිර්දේශ ලබා ගෙන වාහන අළලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කළ යුතුය.
(ඓ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව අනුව අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) තනතුර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක්, සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 06 ක් ඇතුළු පුරප්පාඩු 38 ක් සහ සංවර්ධන නිලධාරී තනතුරු 08 ක අතිරික්තතාවයක් පැවති අතර රියදුරු තනතුරු 02 ක හා කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා අනියම් සේවකයින් යොදවා තිබුණි.	අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුම් දී ඇත.	බඳවාගැනීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුයි.
(ඔ)	පළාතේ පළාත් සභා පාසල්වල විදුහල්පති තනතුරුවල පුරප්පාඩු 323 ක් ද, නියෝජ්‍ය විදුහල්පති තනතුරු 114 ක අතිරික්තතාවක් ද, ද්විතීයික මට්ටමේ ගුරුභවතුන් 948 ක්, කළමනාකරණ සේවා නිලධාරීන් 51 ක්, රසායනාගාර සහකාර, මුරකරු ඇතුළු ප්‍රාථමික මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 66 ක් සහ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු 391 ක් හා පාසල් කාර්යාල සහායක තනතුරු 50	අදාළ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත.	අත්‍යාවශ්‍යම තනතුරු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.

	ක අතිරික්තයක් ද වන අතර අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු යොදවාගෙන තිබුණි.		
(ඕ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පළාත් සභා පාසල්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය විෂයයන්හි ගුරු පුරප්පාඩු 2,238 ක් පැවතුණි.	පවතින ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අදාල ගැසට් නිවේදනය සකස් කර ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුයි.
(ඖ)	අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් පාසැල් වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරීමේ දී, බෙදාහැරීමේ දී ඒ හා සම්බන්ධ වෙනත් අවස්ථාවලදී විභාගය පැවැත්වීමට පෙර ප්‍රශ්ණ පත්‍ර සහ අනුමත පිළිතුරු පත්‍ර පිටවීම් සමාලෝචිත වර්ෂයේ අවස්ථා කිහිපයක දී සිදු වි තිබුණු අතර ජාතික මට්ටමේ විභාගයක් වන 5 වසර ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමේ දී ද විභාගය අවසන් වීමට පෙර ප්‍රශ්න පත්‍ර සමාජ මාධ්‍යයට මුදා හැරීමක් පළාතේ විභාග මධ්‍යස්ථානයකදී සිදු වී තිබුණි.	මේ සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතී.	මේ සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගත යුතුයි.
(ක)	සමාලෝචිත වර්ෂයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව රු.71,185,440 කට සෘජුවම මිල දී ගෙන තිබූ ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ ඒකක 854 ක් සහ ප්‍රධාන අමාත්‍යාංශ වැය විෂයයන් තුළින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට රු.මි 47.7 කට මිල දී ගෙන තිබුණු ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කර හෝ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	කඩිනමින් එම භාණ්ඩ අප දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරන බව	වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුයි.

(ඛ)	දිඹුලාගල හා පොළොන්නරුව කලාප කාර්යාලවල පරිගණක විද්‍යාගාර 14 ක පරිගණක 293 ක් අක්‍රීයව පැවතුණි. පළාතේ පාසල්වල විද්‍යාගාරවල අක්‍රීය පරිගණක පිළිබඳ දත්ත පද්ධති ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	පරිගණක පැරණි බැවින් උපාංග සොයා ගැනීම අපහසු බවත් සුලු අලුත්වැඩියාවන් සිදු කරන බවත් දන්වා ඇත.	තාක්ෂණික විෂයභාර අධ්‍යක්ෂවරයා විසින් පරිසණක විද්‍යාගාර ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වාගැනීමට කටයුතු කළ යුතුයි.
(ග)	2015 අංක 01 දරන ළමයින් අනිවාර්යයෙන් පාසල්වලට පැමිණීමේ නියෝගවලට අදාළව 2016 අප්‍රේල් 20 වන දින නිකුත් කරන ලද අංක 1963/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 4(4), 4(5)3 නිවේදනය අනුව පාසැල් හැරයන ළමුන් පිළිබඳ තොරතුරු හඳුනාගෙන මූලික සාක්ෂරතාවය නොමැති හා සමාජ විෂමාචාරවලට යොමුවන දරුවන්ගේ ප්‍රමාණය අවම කිරීමට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බලධාරීන් කටයුතු කර නොතිබුණි.	අනිවාර්යය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණද නිලධාරී හිඟය නිසා කමිටු පත් කිරීම හා යාවත්කාලීන කිරීම විධිමත්ව සිදුවී නොමැති බවට දන්වා ඇත.	අනිවාර්යය අධ්‍යාපන නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුයි.
(ඝ)	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු ඇගයීම් කරන අවස්ථාවේදී තාක්ෂණික පිරිවිතරවලට අනුකූලව ලංසු ඉදිරිපත් කර තිබිය දී හා අලෙවියෙන් පසු සේවා සැපයීමට නියෝජිතවරයකු සිටිය දී සේවා ස්ථානයක් නොමැති ලෙස දක්වා අවම මිල ප්‍රතික්ශේප කිරීම හේතුවෙන් අවස්ථා 02 කදී Smart board 135 ක් මිලදී ගැනීමේදී රු.4,050,000 ක හා Desktop Computer 207 ක් මිලදී ගැනීමේදී රු.7,890,840 ක අලාභයක් සිදුවී තිබුණි.	පූර්ව ලංසු පරික්ෂාවේදි ඉල්ලා ඇති පිරිවිතර හා කොන්දෙසි සම්පූර්ණ නොකිරිම හේතුවෙන් ලංසුව ප්‍රතික්ෂේප වී ඇති බව දක්වා ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

1.5.9 ශීර්ෂය 620 - පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යංශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
පළාත් කෘෂිකර්ම අමාත්‍යංශයේ උතුරු මැද පළාත තුල වාරිමාර්ග ජලාශ 3,000කට ආසන්න ප්‍රමාණයක් පැවතියද ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීමේ ව්‍යාපෘතිය සඳහා ධීවර සමිති 57 ක් තෝරා ගෙන	ධීවර සමිතිවල මූල්‍ය ශක්තිය වැඩි කිරීම සඳහා ඉදිරියේදී පියවර ගනිමි.	තාත්ත්වික ඉලක්කයක් දැක්විය යුතු අතර, එකී ඉලක්ක සපුරාලීමට කටයුතු කළ යුතුයි.

අවස්ථා 75 දී වැව් 41කට පමණක් මත්ස්‍ය පැටවුන් බහාලීම සිදු කර තිබුණි. 2024 වර්ෂයේදී රු.7,223,038 ක වියදමක් දරා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැර තිබුණේ වාර්ෂික අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 48 ක් පමණි.		

1.5.10 ශීර්ෂය 622 - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	පළාත් නිශ්චිත් සංවර්ධන ප්‍රදාන යටතේ 2021 වර්ෂයේ රු.14,472,387 ක වියදමක් දරා සත්ත්ව ගොවිපල තොරතුරු හා දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර තිබූ නමුත් පළාත තුළ ක්‍රියාකාරී මට්ටමේ පවතින ගොවිපළ 19,267 න් 12,221 ක දත්ත රැස්කර තිබූ අතර එම දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කර සම්පූර්ණ කර නොතිබුණි.	මේ සඳහා වන නිළධාරීන් සහ අනෙකුත් පහසුකම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි	සක්‍යතා අධ්‍යනයක් සිදුකර උක්ත පද්ධතිය ස්ථාපිත කිරීමේ වියදම සමඟ සසඳා උක්ත පද්ධති ලබා ගැනීමටත් , එසේම උක්ත පද්ධති ස්ථාපිත කළ පසු අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ආ)	උතුරු මැද පළාත තුල සත්ත්ව පාලනය වැඩිදියුණු කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අරමුණක් වුවද, 2021 වර්ෂයේ ලියාපදිංචි සත්ත්ව ගොවිපල 45,399 ක් පැවතුණද, 2024 වන විට එයින් සත්ත්ව ගොවිපල 26,132 ක් බවට අඩුවීමෙන් සත්ත්ව ගොවිපොලවල් සියයට 57 කින් පහළ වැටී තිබීම මත සත්ත්ව නිෂ්පාදන වැඩි දියුණු කිරීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වේ.	නිවැරදි ගොවිපොල සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කළ නොහැකි අතර මේ සඳහා ගොවිපොල සංගණනයක් සිදු කළ යුතු බව දක්වා ඇත.	සත්ත්ව ගොවිපොළවල් පිළිබඳ නිවැරදි දත්ත පවත්වා ගනිමින් පළාතේ සත්ව ගහනය වැඩි කළ යුතුයි.

1.5.11 ශීර්ෂය 630 - පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය , සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	උතුරු මැද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යන ආයතනවලට අදාළ සිදුවීම් 40 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන මණ්ඩලය	පිළිතුරු ලැබී නැත	මූලික විමර්ශන කටයුතු අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුයි.

	පත් කර 2025 අගෝස්තු 30 දින වන විට මාස 06 ත් වසර 12 අතර කාලයක් ගත වී ඇතත් එම කටයුතු අවසන් කර වාර්තා ලබා දී නොතිබුණි.		
(ආ)	පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂක තනතුරේ සේවයේ නියුතුව සිටි නිලධාරියෙක් විධිමත් අනුමැතියකින් තොරව විදේශගතවීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වැනි වගන්තියට අනුව සුදුසු නිලධාරියෙකු පත් කර මසක් ඇතුළත මූලික විමර්ශනයක් පවත්වා විනයානුකූලව කටයුතු කිරීම සඳහා අදාළ විමර්ශන වාර්තාව හා කෙටුම්පත් චෝදනා පත්‍රය ඉදිරිපත් කර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත	මූලික විමර්ශනයක් පවත්වා ඉදිරි කටයුතු සිදු කළ යුතුයි.

1.5.12 ශීර්ෂය 631 - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 44 ක් සඳහා අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03.1 ප්‍රකාරව වර්ෂ 01 ත් 07 ත් අතර කාලයක් ගත වී ඇතත් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.	ඉතිරි වාහනවල ඉන්ධන පරික්ෂාව කඩිනමින් අවසන් කිරීමට සැලසුම් කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුයි.
(ආ)	අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සනාථ කිරිමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 02 ක මඟින් රු.1,677,255,654 ක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.	2024 ජනවාරි නව ඇඟිලි සළකුණු යන්ත්‍ර මිලදී ගත්තද එම යන්ත්‍රවල දෝෂ පවතින බැවින් එම දෝෂ නිවැරදි කර භාවිතයට ගත හැකි බව	ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමෙන් පමණක් අතිකාල දීමනා ගෙවිය යුතුය.

(ඇ)	ප්‍රධාන ලේකම්වරයාගේ 2024 ජූලි 24 දිනැති අංක 2024/08 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ වගු අංක 01 ට අනුව තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුව භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සඳහා අනුමත අධිකාරී සීමාව රු.මිලියන 7.5 ක් වුවත්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු.මිලියන 8.9 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 57 ක් මිලදී ගැනීමේ දී එම අධිකාරී සීමාව ඉක්මවා වියදම් දරා තිබුණි. එසේම එකී අධිකාරී සීමාව නොසලකා හැර සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 8.75 ක් වියදම් කර ටයර් මිල දී ගැනීම ද සිදු කර තිබුණි.	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු අනුමත සීමාව ඉක්මවා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව පිළිගෙන ඇත.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අධිකාරී සීමාව තුළ මිල දී ගැනීම් සිදු කළ යුතුයි.
(ඈ)	2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 05 වැනි වගන්තිය පරිදි පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමන කටයුතු මඟින් උපයන ගාස්තුවලින් සියයට 50 ක් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් පළාත් සභාව වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, 2021 වර්ෂය දක්වා වූ රු.1,452,950 ක මුදලක් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ප්‍රේෂණය කර තිබුණු අතර, එම රු.1,452,950 ක මුදල පළාත් සභාව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	රු.1,452,950 ක මුදල පළාත් භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කරමි.	මෙම මුදල් පළාත් සභාව වෙත ප්‍රේෂණය කිරීමට කටයතු කළ යුතුයි.

(ඉ)	ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බව වර්ධනය කිරීම එනම්, ජීවිත කාලය පුරාම විස්තීර්ණ, ප්‍රවර්ධන, ආරක්ෂණ, වැළැක්වීම්, රෝග නිවාරණ, පුනරුත්ථාපන හා රෝග සත්කාර මඟින් ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙන්ම බෝ නොවන රෝග අවධානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමනාකරණය කිරීම අරමුණින් ලෝක බැංකු ආධාර යටතේ 2019 වර්ෂයේ දී ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ ද, එම අරමුණුවලට පටහැනිව 2019 වර්ෂයේ සිට 2024 ජුලි 31 දින දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදනවලින් රු.335,691,431 ක මුදලක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සත් මහල් නව පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වැය කර තිබූ අතරම රු.51,609,432 ක මුදලක් එම ගොඩනැගිල්ල සඳහා උපකරණ මිල දී ගැනීමට වියදම් කර තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ඊ)	වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන යටතේ රු.මිලියන 500 ක පමණ පිරිවැයක් දරා මෙත්සිරි සෙවන වකුගඩු රෝග සහන සත්කාර හා පර්යේෂණ මධ්‍යස්ථාන ඉදිකර 2019 මාර්තු 20 දින ජනතා අයිතියට පත් කර තිබුණු නමුත් මෙතෙක් අයිතිය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත පවරා නොතිබුණ අතර ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ගැටළු පැන නැගී තිබුණි.	මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් මේ වන තෙක් ලබා දී නොමැත.	මෙම ගොඩනැගිල්ලේ අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගත යුතුයි.

(උ)	පළාත් භාණ්ඩාගාර 2014/14 චක්‍රලේඛයේ 2.1 (II) ඡේදයේ ප්‍රකාරව යම් ඉඩමක් ඔප්පුවකින් විධිමත් ලෙස පැවරී නැතත් දැනට යම් ආයතනයක් එම ඉඩම් භුක්ති විඳින්නේ නම් ආයතන තම වත්කමක් ලෙස සළකා ලේඛන ගත කළ යුතු වුවද පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත ආයතන භුක්ති විඳින ඉඩම් 161 ක් වත්කම් ලෙස හඳුනාගෙන වත්කම් කළමණාකරන පද්ධතියට ඇතුළත් කර නොතිබුණු අතර පොළොන්නරුව, දිඹුලාගල හා හිඟුරක්ගොඩ කලාප වලට අයත් ඉඩම සහ ගොඩනැගිලි 240 ක් නිල නිවාස 04ක් වත්කම් ලෙස හඳුනාගෙන ලේඛන ගතකර නොතිබුණි.	තොරතුරු රැස් කිරීමට යම් කාලයක් ගතවන බැවින් වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීමට ප්‍රමාදවන බව දන්වා ඇත.	පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඌ)	පළාත තුළ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 24 ක හිඟයක් පවතින අතර අනෙකුත් වෛද්‍යවරු 335 ක ගේද ඌනතාවයක් පවතී හෙද නිලධාරීන් 54 ක්ද තාක්ෂණික සේවයේ නිලධාරීන් 51 ක්ද සෞඛ්‍ය කාර්යය සහයක උපස්ථාන හා වෙනත් නිලධාරීන් 510 කගේ ඌනතාවයක් පවතී.	පිළිතුරු ලබා දී නොමැත	පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි.
(එ)	2022 දෙසැම්බර් 13 දින කහටගස්දිගිලිය මූලික රෝහල වෙත ලැබී තිබූ රු.6,100,000 (VAT රහිත) වටිනා FCR Prima 72 CR system යන්ත්‍රය විගණිත දින වූ 2025 සැප්තැම්බර් 30 දින වන විටත් කිසිදු භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවති අතර, මෙම යන්ත්‍රය සවි කිරීම සඳහා රෝහලේ පැවති පැරණි ගොඩනැගිල්ලක් විකිරණ ඒකකය ලෙස වැඩිදියුණු කර	මෙම යන්ත්‍රය රෝගී සත්කාරක කටයුතු සඳහා යොමු කිරීමට කඩිනමින් කටයුතු කරමි.	විකිරණ අංශය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.

	තිබූ අතර, ඒ සඳහා ද රු.3,524,634 ක මුදලක් වැය කර තිබුණි. ඒ අනුව රු.9,624,634 ක පමණ මුදලක් වැය කර ඉදි කර තිබූ රෝහල් විකිරණ අංශය ඉදි කර මේ වන විට වසර 03 කට ආසන්න කාලයක් ගත වී ඇතත් රෝගී සත්කාරක කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්ය පැවති අතර, යන්ත්‍රයේ වගකීම් කාලය වන වසර 02 ක කාලය ද ඉක්ම ගොස් තිබුණි.		
(ඒ)	පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය නොමැති සැපයුම්කරුවකුගෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,693,800 ක් වටිනා Patient trolley 20 ක්, IV trolley 30 ක් හා Dressing trolley 30 ක් මිලට ගෙන තිබුණි.	ලංසු ලේඛනවල NIMRA අනුමැතිය අවශ්‍ය බව සඳහන් වුවද මෙම උපකරණ මිලදී ගැනීම සඳහා NIMRA අනුමත සහතිකය අවශ්‍ය නොවන බව ජීව වෛද්‍යරයා දන්වා ඇති බව.	නිවැරදිව ලංසු ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඓ)	පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට රෝද පුටු Patient trolley, IV trolley, Dressing trolley Multipara Monitors, ECG machine හා Electronic weighting scale යන ජීව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම්වලදී සැපයුම්කරුවන්ගෙන් අය කර ගත යුතු රු.394,668 ක ප්‍රමාද ගාස්තු අයකර නොගෙන උපකරණවල සම්පූර්ණ වටිනාකම එකවර ගෙවා තිබුණි.	සැපයුම්කරුවන්ගේ පාලනයකින් තොරව සිදුවන ප්‍රමාදයන් ගැන සාධාරණව සලකා බලා ප්‍රමාද ගාස්තු අය නොකරන ලදි.	සැපයුම්කරු සමඟ ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඔ)	පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා Multipara Monitors 20 ක් මිලදී ගැනීමේදී අවම ලංසු ඉදිරිපත් කර තිබුණු ආයතන 02 ක ලංසු පිළිගතහැකි හේතු දැක්වීමකින් තොරව	ලංසු සුරක්ෂණවල දිනයන් වෙනස් වීමත් භාණ්ඩ සැපයීමේදී නිෂ්පාදන සමාගමෙන් ආනයනය කොට ලබාදීමට සිදු වීමත් නිසා අවම ලංසු ඉදිරිපත්කර තිබූ ආයතන දෙක ප්‍රතික්ෂේප කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුයි.

	ප්‍රතික්ෂේප කර, තෙවනුවට අඩුම ලංසු ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් එම උපකරණ මිලදී ගැනීමෙන් රු.4,012,000 ක අලාභයක් සිදු වී තිබුණි.		
(ඕ)	පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ශ්‍රවණාගාරයට පුටු මිලදී ගැනීම සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇස්තමේන්තු ගත මුදල රු.1,600,000 ක් වුවද, පුටු මිලදී ගත් අඩුම ලංසුව සහිත මිල රු.2,600,000 (වැට් රහිත) ක් වීමෙන් ඇස්තමේන්තු ගත මුදල ඉක්මවා මිලදී ගැනීම් කර ඇති අතර, පුටුවල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර මුළු මුදල වන රු.3,068,000 ක් ගෙවා තිබුණි.	අදාළ වැය විෂය සඳහා වෙන් වූ වාර්ෂික ප්‍රතිපාදන සීමාව තුළ ඇස්තමේන්තුගත මිලට වඩා මිල වැඩි වුවද මිලදීගත හැකි බැවින් මිලදී ගැනීම සිදුකර ඇති බව දන්වා ඇත. ඇනවුම් කරන පුටු පොළවට සවිකර තැබිය යුතු ඒවා බැවින් ඉහත අවශ්‍යතාවයට නොගැලපීම මත අමතර කොටස් යොදා සකසා ගැනීමට තීරණය කර ඇති බව දන්වා ඇත.	තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමෙන් පසු පමණක් අවසන් ගෙවීම් කළ යුතු අතර පුටු ශ්‍රවනාගාරයේ ස්ථාපිත කර භාවිතයට ගත යුතුයි.

1.5.13 පරිවාස හා ළමා රක්ෂණ අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
උතුරුමැද පළාත් ළමාරක්ෂක සේවා අරමුදලේ ප්‍රධාන කාර්යය පළාත තුළ දරුවන්ගේ කායික, මානසික සහ සදාචාරාත්මක වර්ධනය අවශ්‍ය මූලික පහසුකම් සැපයීම හා ආරක්ෂාව හා සුභ සාධනය සැපයීමය. ඒ අනුව එම කාර්යය ඉටු කර ගැනීම සඳහා 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම උප කාර්යයන් 05 ක් යටතේ සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසානවන විට එම කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට නොහැකි වීම මත 2024 ඔක්තෝබර් 21 දින හා 2024 දෙසැම්බර් 30 දින එනම් වර්ෂය අවසානයේ සැලසුම් සංශෝධනය කර තිබුණි.	ප්‍රතිලාභ ඉල්ලුම්කරන සුදුසුකම් සපුරා ඇති දරුවන් සඳහා ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් මෙලෙස සංශෝධන සිදු කර ඇති බව.	ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.14 ශීර්ෂය 632 - පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රු.649,000 ක් වටිනා ඇඟිලි සලකුණු යන්ත්‍ර 10 ක් මිල දී ගෙන පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සවිකර ඇතත් එම යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	මින්නේරිය ආයුර්වේද රෝහලෙහි මුළුතැන්ගෙය අලුත්වැඩියාව කොන්ත්‍රාත් 02 ක් මගින් සිදුකරගෙන තිබුණු අතර රු.3,331,725 ක වටිනාකම ඇති එක් කොන්ත්‍රාත්තුවකට අදාළ රු.975,747 ක වටිනාකමක් ඇති කාර්යයන් ඉටුනොකර ඒ වෙනුවට මුල් ඇස්තමේන්තුවේ ඇතුළත් නොවූ රු.1,017,456 ක් වටිනා වෙනත් කාර්යයන් ඉටුකර තිබුණි. එසේම රු.2,731,180 කට ගිවිසුම්ගත වූ අනෙක් කොන්ත්‍රාත්තුවෙහි රු.984,429 ක් වටිනාකම ඇති කාර්යය ඉටු නොකර ඒ වෙනුවට රු.1,065,958 ක් වටිනා වෙනත් කාර්යයන් අනුමැතියකින් තොරව ඉටුකර තිබුණි. මෙම කොන්ත්‍රාත් සඳහා නිවැරදි ඇස්තමේන්තුවක් ද පිළියෙල නොකිරීම ඊට හේතුව බව නිරීක්ෂණය විය.	ඇස්තමේන්තු අගයට වඩා ගොඩනැගිල්ල භෞතිකව අලුත්වැඩියාවේදී මිනුම් වැඩිවී ඇති බව දන්වා ඇත.	වැඩබිම අධීක්ෂණය කර විචලනයන් අවම වන පරිදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුයි.
(ඇ)	පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරී තනතුරක් අනුමතව තිබුණ ද, මෙම තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රෝගී සත්කාරක සේවා ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයේ දී ප්‍රතිපාදන සලසා තිබූ පාරම්පරික වෙදකම දිරිගැන්වීමේ වැඩසටහන්, ප්‍රවර්ධන වැඩසටහන් හා වැඩමුළු සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් සඳහා වෙන් වී තිබූ රු.3,600,000 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.	ඉදිරියේදී අදාළ තනතුර සඳහා සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු පත් කිරීමට අයදුම්පත් කැඳවා ඇත.	පුරප්පාඩු වෛද්‍ය නිලධාරීන් තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුයි.

(ඇ)	උතුරුමැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරු සඳහා අවුරුද්දකට වඩා වැඩි කාලයක සිට ස්ථිර නිලධාරියෙකු පත් කර නොතිබුණි. දෙපාර්තමේන්තුව සඳහා විශේෂඥ වෛද්‍ය නිලධාරී තනතුරු 07 ක් අනුමත වී තිබුණ ද, කිසිදු විශේෂඥ වෛද්‍යවරයෙකු සමාලෝචිත වර්ෂය තුළදී යොදවාගෙන නොතිබුණි.	නව බඳවාගැනීම් ආරම්භ කළ විගස මෙම ගැටලුව විසඳා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.	ස්ථිර නිලධාරීන් පත්කිරීමට කටයුතු කළ යුතුයි.
(ඉ)	මනම්පිටිය ග්‍රාමීය ආයුර්වේද රෝහලට පානීය ජලය ලබාගැනීම සඳහා ජලය ලීටර් 7000 ක් පිරවිය හැකි ජල ටැංකි 02 ක් ඉදිකිරීම සඳහා රු.1,122,450 ක මුදලක් වැයකර තිබුණද, එම ටැංකි දෙකෙහි ඉදිකිරීමේ දී සිදු වී තිබූ තාක්ෂණික දෝෂයක් නිසා ජලය ලීටර් 4000 ක ධාරිතාවයක් පමණක් පිරවීමට හැකි වීමෙන් රෝහලේ පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. එම තත්ත්වය එසේම තිබිය දී අතිරේක වැඩ සඳහා රු.133,767ක් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.	ජල ටැංකි දෙක නිවැරදිව ලෙවල් කිරීමෙන් පසු ජලය උපරිම ධාරිතාවයෙන් ගබඩා කළ හැකි බවත් හා සියයට 10 සීමාව තුළ ඉංජිනේරුවරයාගේ නිර්දේශ මත අතිරේක වැඩ සඳහා ගෙවීම් කළ හැකිය.	ඉදිකර ඇති ජල ටැංකි උපරිම ධාරිතාවයෙන් භාවිතයට ගත යුතුයි.
(ඊ)	මින්නේරිය ආයුර්වේද රෝහලේ පංචකර්ම ඒකකය පිහිටුවීමේ ප්‍රධාන අරමුණක් වූයේ විදේශිකයින්ට සේවා සැපයීම වුවත්, කාර්යය මණ්ඩල පුරප්පාඩු හා භෞතික සම්පත්වල ඌණතාවය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එක් විදේශිකයෙකුවත් ආකර්ශනය කර ගැනීමට නොහැකි වී තිබුණි.	කාර්යය මණ්ඩල පුරප්පාඩු හා භෞතික සම්පත්වල ඌනතාවය හේතුවෙන් මේ වනතෙක් විදේශකයින් සඳහා සේවා සැපයීමට නොහැකි වී ඇත.	පංචකර්ම ඒකකය පිහිටුවීමේ අරමුණු ළඟා කර ගැනීම සඳහා උපරිම ධාරිතාවයෙන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.15 ශීර්ෂය 633 - පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	පරිවාස දෙපාර්තමේන්තුවේ උප කාර්යාල 09 ක් සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර නොතිබුණි.	ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපිත කළ හැකි ආයතන මොනවාද යන්න පිළිබඳ සක්‍යතා අධ්‍යනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබනු ලැබේ.	සියළුම ආයතනවල ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කළ යුතුය.
(ආ)	පළාත් පරිවාස දෙපාර්තමේන්තුව විසින් 2022 අප්‍රේල් 22 දින සිට ආරම්භ කරන ලද නව පරිවාස කාර්යාල වන නොච්චියාගම, මැදවච්චිය හා කහටගස්දිගිලිය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ගෙන නොතිබුණි. එමෙන්ම පරිවාස නිලධාරී තනතුරු 02 ක් සඳහා සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු රාජකාරී ආවරණයට යොදවා තිබුණු අතර, උපදේශක නිලධාරී තනතුරු 04 ක ඌනතාවයක් පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත	නව කාර්යාල සඳහා කාර්යය මණ්ඩලය අනුමත කර ගත යුතුය.

1.5.16 640 – 03 -04 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
උතුරු මැද පළාත් සභාව විසින් 2022 ඔක්තෝබර් 03 දින සිට ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා භාවිතා කළ ERL 01 පද්ධතිය වෙනුවට ERL 02 නමින් නව පද්ධතියක් හඳුන්වා දී තිබූ නමුත් එම පද්ධතිය මඟින් ආදායම් බලපත්‍ර ලබාගත හැක්කේ මෝටර් රථ දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය තුළ ලියාපදිංචි වාහන සඳහා පමණක් වී හේතුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ලියාපදිංචි කරන ලද වාහන සම්බන්ධ තොරතුරු මෙම පද්ධතිය තුළ ඇතුළත් කර නොමැති වීම නිසා වාහන හිමියන් අපහසුතාවයට ලක් වී තිබුණි.	මෙම පද්ධතියට ඇතුළත් නොවූ වාහන ඇතුළත් කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව.	ලියාපදිංචි සියලුම වාහනවල තොරතුරු ලබාගත හැකිවන පරිදි පද්ධතිය සැකසිය යුතුයි.

1.5.17 ශීර්ෂය 641 - පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2009 අංක 05 දරන සමූපකාර ප්‍රඥප්තියේ 58(3) වගන්තිය ප්‍රකාරව බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් වෙත ලැබී තිබුණු අභියාචනා 71 න්, අභියාචනා 25 ක් පමණක් නිම කර තිබුණු අතර අභියාචනා 46 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අභියාචනා සම්බන්ධයෙන් අභියාචනාකරුවන් විසින් රු.1,269,128 ක මුදල් තැන්පත් කර තිබුණි.	අභියාචනා කටයුතු අවසන් කරමින් පවතින බව දන්වා ඇත.	තවදුරටත් නිරවුල් කළ යුතු ආරවුල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සී/ස වීරපුර ස.ණ.ස. සමිතිය යටතේ පාලනය වන ස.ණ.ස සංවර්ධන බැංකුවේ රු.49,287,765 ක තැන්පත් මුදල් එහි නිලධාරින් 03 දෙනෙකු විසින් 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වංචා කර තිබු අතර එම රු.49,287,765 ක මුදල 2025 අගෝස්තු 30 දින වන විටත් අයකර නොතිබුණු අතර, එම වටිනාකමින් 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාල සීමාවට අදාළව රු.15,717,062 ක් වූ මුදල අයකර ගැනීමට තීරකවරුන් පත් කිරීමටද කටයුතු කර නොතිබුණි.	2014 හා 2016 වර්ෂවල මුදල් එකවර ගෙවන ලෙස උසාවිය තීන්දුකර ඇත.2015,2017,2018,2019,2020 වර්ෂ සඳහා තීරකවරු පත්කර ඇත.ප්‍රදානයන් ලබාදීමට තිබේ.	වංචාකර තිබුණු මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ඇ)	සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනම් ණය සහන ලබාදීමේ වැඩසටහන සඳහා වූ ගිවිසුම් 1(VIII) උප වගන්තිය ප්‍රකාරව තුන් වන පාර්ශවය වෙත ලබා දෙන ලද ණය මුදල තුන් වන පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත මාස 06 ක කාලසීමාවක් ඇතුළත සම්පූර්ණයෙන්ම ගෙවා නිදහස් කළ යුතු වුවත්, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල්	තව දුරටත් රුපියල් මිලියන 27 ක් ගෙවීමට ඇති බවත් පළාත් සභා නීති නිලධාරීන්ගේ උපදෙස් ලබාගෙන අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබේ.	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි

නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත 2021 වර්ෂයේ දී ලබාදී තිබුණු රුපියල් මිලියන 33 ක ණය මුදලින් 2024 දෙසැම්බර් 31 දින වන විට ද රුපියල් මිලියන 27.65 ක් අයකරගෙන නොතිබුණි.

1.5.18 මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
නව මාර්ග බලපත්‍ර ලබා දීමේදී මාර්ග සමීක්ෂණයක් සිදුකර දැනට පුරප්පාඩු සහිත මාර්ගයන් හඳුනාගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව සිදුකළ යුතු වුවත්, අධිකාරිය විසින් නව මාර්ග බලපත්‍ර ලබාදීමේදී එලෙස කටයුතු නොකර, තනි පුද්ගල ඉල්ලීම් මත නව මාර්ග බලපත්‍ර ලබා දී තිබුණි.	ප්‍රධාන මාර්ග දැනටමත් සම්පූර්ණ වී ඇති බැවින් නව මාර්ග බලපත්‍ර ලබා දීමේ හැකියාවක් නොමැති බව දක්වා ඇත.	පුරප්පාඩු සහිත මාර්ගයන් හඳුනාගෙන නව මාර්ග බලපත්‍ර ලබාදීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුයි.

1.5.19 උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටුකර ගැනීමට අදාළව ප්‍රධාන කාර්යයන් 05 ක් අධිකාරිය විසින් හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී ව්‍යවසායිකයන් 33 දෙනෙකු සඳහා රු.6,450,000 ක මූල්‍ය පහසුකම් සැපයීම පමණක් සිදු කර තිබුණු අතර සැලැස්මේ ඇතුළත් කර තිබුණු ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික ව්‍යවසායක පුහුණු ලබාදීම, ව්‍යවසායක සංගම් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යෑම හා කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා වෙළඳපොල අවස්ථා හඳුනා ගැනීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.	2025 වර්ෂයේදී ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා කළ යුතුයි.

(ආ)	සුළු පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩසටහන් යටතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වර්ෂවලදී ලබාදී තිබුණු සුළු පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩ සටහන් වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණයලාභීන් 177 දෙනෙකුගෙන් රු.11,640,262 ක ශේෂයයක් අයවීමට පැවතුණි. මින් ණයලාභින් 04 දෙනෙකුගේ රු.61,502 ක් වූ ශේෂය අවුරුදු 05 කට අධික කාලයක් අය නොවී පැවතුණු අතර රු.215,596 ක් වූ ණය ශේෂය වසර 03 ත් 05 ත් අතර කාලයක් අය නොවී පැවතුණි.	ඉදිරියේදී ණය මුදල් අයකර අවසන් කිරීමට කටයුතු කරමි.	ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.20 සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
අරමුදල විසින් පවත්වා ගෙන යන අංක 008-1-001-8-1725884 දරන ගිණුමට අදාළව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.370,555 ක් වටිනාකම වූ චෙක්පත් 36 ක්ද, 2016 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.3,116,258 ක් වූ හඳුනා නොගත් ලැබීම් 201 ක්ද, 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 82 කට අදාළ උපලබ්ධි නොවූ තැන්පත් වල වටිනාකම රු.1,188,740 ක් හා 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ හඳුනා නොගත් බැංකු ඍජු හර කිරීම් අවස්ථා 18 ක වටිනාකම රු.192,609 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල් කර නොතිබුණි.	නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබේ.	කඩිනමින් නිරවුල් කළ යුතුය.

1.5.21 ශීර්ෂය 652 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2021 පෙබරවාරි 01 දිනැති 2020/06 චක්‍රලේඛය හා අමප/20/1622/322/004 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව ඉඩම් කොමසාරිස්වරයා විසින් බදු සහන ලබා දීම හේතුවෙන් උතුරු මැද පළාත් සභාවට රු.73,404,958 ක බදු මුදලක් අහිමි වී තිබුණි.	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2025.06.11 දිනැති අංක 04/10/පොදු/බදුසහන/(1,2) දිනැති ලිපිය මඟින් ලබා දී තිබුණු බදු සහන ඉවත් කර හිඟ බදු මුදල්ද සමඟ බදු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.	නිසි පරිදි බදු මුදල් අය කළ යුතුයි.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 කට අදාළව අයවිය යුතු දිර්ඝ කාලීන ඉඩම් බලපත්‍ර ගාස්තුව රු.469,419,077 ක් පැවති අතර, ඒ තුල වසර 1-3ත් අතර අයවිය යුතු රු.159,664,553ක් ද, වසර 03කට වඩා පැරණි ශේෂයන්ගේ වටිනාකම රු.204,042,991 ක් ද විය.	හිඟ ආදායමක් රැස් කර ගැනීමට කටයුතු කරන බව .	අයවිය යුතු ඉඩම් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුයි.
(ඇ)	පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝ කාලීන බදු පදනමෙන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබා දී වසර 02 ත් 14 ත් අතර කාලයක් ගත වී තිබුණ ද එලෙස ඉඩම් ඉල්ලුම් කර තිබු අයදුම්පත් 123 කට අදාළව ඉඩම් ලාභීන් වෙත දිර්ඝකාලීන බලපත්‍ර ලබා දී නොතිබුණ ද බලපත්‍ර නොලබමින් ඔවුන් එකී ඉඩම් භුක්ති විඳින නමුදු ඒ පිළිබඳ පසු විපරම් කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ පිළිබඳව පසු විපරම් කිරීමට කටයුතු කරන බව.	බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇති ඉඩම් සඳහා එම බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර, බලපත්‍ර නොමැතිව ඉඩම් භුක්ති විඳිම පිළිබඳ පසුවිපරම් කළ යුතුය.
(ඈ)	මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් අක්කර 80 ක භූමි ප්‍රමාණයක් දේශීය ආයෝජකයින් 20 දෙනෙකු සඳහා 2022 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු අනුමැතියට යටත්ව වසර 35 ක කාලයකට ලබා දී තිබුණු අතර, බදු අනුමැති ලිපියේ "ඇ" වගන්තිය ප්‍රකාරව බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී ඉඩම සංවර්ධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට බලපත්‍රලාභීන් 16 දෙනෙකු එසේ සිදුකර නොතිබුණි.	ලබාදෙන ලද ඉඩම් කට්ටි 24 න් ඉඩම් කට්ටි 04 ක් පමණක් සංවර්ධනය කර ඇත.	ආයෝජනයන් යොදවා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කඩිනම් කළ යුතුයි.

(ඉ)	ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දිරි දීමනා ගෙවීමේදී නව බදු ආදායම හා එක් එක් නිලධාරියාගේ කාර්යසාධනය පදනම් කරගෙන / එකතු කරන ලද හිඟ බදු ආදායම පදනම් කරගෙන දිරි දීමනා ගණනය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී හිඟ බදු ආදායම ඇතුළත් රු.338,032,027 ක් වූ ආදායම් පදනම් කරගෙන දිරි දීමනා ගෙවීම් කර තිබුණි. ඒ හේතුවෙන් නිලධාරීන් නව බදු අයකිරීම වෙනුවෙන් යොමුවීම දුර්වල මට්ටමක පැවතුණි.	බදු අයකිරීම කාර්යක්ෂම කිරීම සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකර ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබේ.	බදු අයකිරීම හා හිඟ බදු අයකිරීම කඩිනම් කළ යුතුයි.

1.5.22 පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්**	**නිර්දේශය**
(අ)	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහ මාර්ග නඩත්තු ව්‍යාපෘති 03 කින් අධිකාරියට රු.1,352,153 ක අලාභයක් සිදුවී තිබුණි.	මින් ඉදිරිය අධිකාරියට ලාභ උත්පාදනය කළ හැකි ව්‍යාපෘති පමණක් ලබා ගැනීමට කටයුතු කරන බව	ව්‍යාපෘති අලාභ නොලබන ලෙස ඉටු කිරීමට කටයුතු කළ යුතුයි.
(ආ)	පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති යන්ත්‍ර කුලී ආදායම රු.42,449,467 ක් සඳහා අධිකාරිය විසින් ක්‍රමවත් ලෙස කුලී ආදායම් ලේඛන පවත්වා ගනිමින් එම ආදායම් සටහන් කිරීම වෙනුවෙන් ආදායම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	2025 වර්ෂයේ සිට ආදායම් ප්‍රභවයන් සඳහා වෙන වෙනම ලේඛන පිළියෙල කිරීමට පියවර ගෙන ඇති බව	ආදායම් ලේඛනය නිවැරදිව අඛණ්ඩව නඩත්තු කළ යුතුයි.
(ඇ)	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2023 මාර්තු 29 දිනැති හා SFC/2023/E/01 අංක දරන සේවා නියුක්ති ආදායමින් (Advance Personal Income Tax (APIT)) බදු අය කිරීම සම්බන්ධ වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ Tax Table 07 අනුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට නිලධාරීන් 07 දෙනෙකුට අදාළ රු.487,198ක ද්විතියික සේවා නියුක්තිය මත අයකළ යුතු බද්ද (APIT) අයකරගෙන තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම ඡේදයට අදාල ව්‍යාපෘතියේ වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ කාර්යාලය මඟිනි. ඒ අනුව අදාල සියළු අය කිරීම් කොළඹ අධීක්ෂණ කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.	ද්විතීක සේවා නියුක්තිය මත අයකළ යුතු බද්ධ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

1.5.23 ග්‍රාම සංවර්ධන අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
පළාත් විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි රීති මඟින් ග්‍රාම සංවර්ධන අරමුදල පාලනය කළ යුතු වුවත්, ප්‍රඥප්තිය සම්මත කර වසර 13 ක් ඉක්ම ගොස් ඇතත් අරමුදලේ රීති සකස් කර නොතිබුණි. පළාත් සභාව විසුරුවා හැර ඇති අවස්ථාවකදී අමාත්‍යවරුන්ගේ බලතල ආණ්ඩුකාරවරයාට පැවරෙන නමුත් ආණ්ඩුකාරවරයා විසින්ද එකී රීති සකස් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදීද කිසිදු මුදලක් ප්‍රතිලාභීන්ට ලබාදී නොතිබුණු අතර රු.1,227,343 ක මුදලක් අරමුදලට අදාළ බැංකු ගිණුමේ හා ස්ථාවර තැන්පතු ගිණුමක රඳවාගෙන තිබුණි.	ඉදිරියේදී ඒ පිළිබඳව කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.	අරමුදලේ රීති සකස් කර අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.24 ශීර්ෂය 653 - පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාල ගොඩනැගිල්ලේ වහලය මත 2019 වර්ෂයේදී රු.3,040,000 ක වැය දරා මාසිකව විදුලි ඒකක 2775 ක ප්‍රමාණයක් ජනනය කරන 25KW ක ධාරිතාවයෙන් යුතු සූර්යය බල විදුලි පද්ධතියක් ස්ථාපනය කර තිබුණු අතර එම සූර්ය බල පද්ධතියෙන් අපේක්ෂිත පරිදි විදුලිය ජනනය නොවීම සම්බන්ධයෙන් පියවර නොගැනීම මත හා ලංසුකරු විසින් ප්‍රසම්පාදන ලියවිලිවල තාක්ෂණික පිරිවිතර 7 ක් යටතේ එකඟව තිබූ කොන්දේසි අනුව පළමු වසර වෙනුවෙන් මිල අය කිරීමකින් තොරව නඩත්තු සිදු කර දීමටත්,	විදුලිය උත්පාදනය නොවන තත්ත්වය/ අඩු විදුලිය උත්පාදනය සම්බන්ධයෙන් විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	2019 වර්ෂයේ සිට මේ දක්වා විධිමත් ක්‍රියාමර්ගයක් නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගත යුතුයි.

	නඩත්තු කටයුතු වෙනුවෙන් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සමඟ ගිවිසුමකට එළඹීමටත් එකඟවී තිබුණද, දෙපාර්ශවය විසින් එවැනි නඩත්තු ගිවිසුමකට එළඹ නොතිබීම මත 2019 සැප්තැම්බර් 19 සිට 2024 ඔක්තෝබර් 18 දක්වා කාලය තුළ පළාත් සභාවට ලබාගත හැකිව තිබූ රු.2,777,654 ක ආදායමක් අහිමි වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් විසින් අවශ්‍ය පියවර ගෙන විදුලි පද්ධතියේ පවතින දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.		

1.5.25 ශීර්ෂය 660 - ප්‍රධාන ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	2005 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා නීති සහය ලබා ගැනීම වෙනුවෙන් රු.4,266,400 ක වටිනාකමක් පළාත් සභාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවීම් කර තිබුණ නමුත්, එම ගෙවීම් තුළ සමාලෝචිත වර්ෂයට පෙර සේවා ලබා ගැනීම් ද ඇතුළත් වන බැවින් මු.රෙ.115 අනුව කටයුතු කර නොතිබුණි.	මු.රෙ 115 ලේඛනයක් නඩත්තු කිරීම මින් ඉදිරියට සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි.	පෙර වර්ෂයේ ගෙවීම් සඳහා අදාළ පරිදි අනුමැතීන් ලබාගත යුතුයි.
(ආ)	උතුරු මැද පළාත් පරිපාලන සංකීර්ණයේ වහලය මත සවිකර තිබූ සූර්යය බල පද්ධතිය මඟින් සාමාන්‍ය මාසිකව ඒකක 16,998 Kwh ක් නිපදවීම් සිදුකරන බවට සැපයුම් ආයතනය එකඟ වී අදාළ පද්ධතිය සවිකර තිබූ නමුත් එම පද්ධතිය මඟින් මාසිකව සාමාන්‍ය ජනනය වන ඒකක ප්‍රමාණය 5650 Kwh කට අඩු මට්ටමක එනම් අපේක්ෂිත ප්‍රමාණයේ සියයට 33.3% කට අඩු ප්‍රමාණයක් විය. ඒ අනුව සූර්ය බල පද්ධතිය ප්‍රසම්පාදනය කරන අවස්ථාවේ අදාළ සමාගම එකඟ වූ Kwh ප්‍රමාණය ජනනය නොවීම හේතුවෙන් පළමු වර්ෂ 05 තුළ අහිමි වූ ආදායම රුපියල් මිලියන 21 ක් විය.	මාසිකව සාමාන්‍යෙන් ජනනය විය හැකි 16988kwh විදුලි ඒකක ප්‍රමාණයට විදුලි බලය හිලව් වීමක් ප්‍රායෝගිකව සිදුනොවේ. මේ පිළිබඳව පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කල කමිටු වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කරමි.	සූර්ය බල පද්ධතිය මඟින් අපේක්ෂිත මාසික ඒකක ප්‍රමාණය නිෂ්පාදනය නොවේ නම් ඒ පිළිබඳව පරීක්ෂා කළ යුතුයි.

(ඇ)	උතුරු මැද පළාත් සභාව සතු ආයතනවලට අයත් රජයේ වාහන 432 ක් 2024 සැප්තැම්බර් 01 සිට 2025 අගෝස්තු 30 දක්වා කාලය වෙනුවෙන් සර්වග්‍රාහී රක්ෂණය සිදු කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවම මිල ගණන් සහිත සුදුසුකම් ලත් ලංසුකරුවකු බැහැර කර වැඩි මිල ගණන්වලට ලංසු ඉදිරිපත් කළ එහෙත් ලංසු ලියකියවිලිවල අපේක්ෂිත සියලු අවශ්‍යතා සපුරා නොතිබුණු ලංසුකරුවකුට ටෙන්ඩර් පිරිනැමීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.2,342,323 ක අලාභයක් සිදු වී තිබුණි.	ඉදිරි කාලයට පූර්ණ රක්ෂනාවරණය සිදු කිරීමේදී දැනට ධාවන තත්ත්වයේ පවතින වාහනවල තොරතුරු පමණක් ඉදිරිපත් කරන ලෙස ආයතන වෙත දන්වා ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිශ්චිත විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඇ)	පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පාඨමාලාව සඳහා ගාස්තු ලෙස පළාත් සභා අරමුදලින් ගෙවා තිබූ රු.7,991,000 කට අදාළව එකී ගෙවීම් කළ නිලධාරීන් 46 දෙනෙකුගේ පාඨමාලා අවසන් කර සහතික ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත භාර දී නොතිබුණි.	මෙතෙක් සහතික භාර නොදුන් නිලධාරීන්වෙත භාරදෙන ලෙස දන්වා ලිඛිතව දැනුම් දී ඇත.	අදාළ පාඨමාලා සාර්ථකව අවසන් කර ඇති බවට ප්‍රතිපාදන ලබාදුන් ආයතනය තහවුරු කර ගත යුතුයි.
(ඉ)	2022 වර්ෂයේදී පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණු මහල් 04 කින් සමන්විත කොරකහවැව පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් 2023 වර්ෂයේ දී වහලය සඳහා රු.28,467,095 ක් ද, රු.28,370,425 ක් ටයිල් ඇතිරීම සඳහාද ගිණි ආරක්ෂණ පද්ධතිය සඳහා රු.2,355,778 ක් ද වැයකර තිබුණි. භාවිතා කල හැකි තත්වයට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට ඉන් මහල් 02 ක් පමණක් භාවිතයට ගෙන තිබුණු අතර ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පුහුණු ආයතනය සඳහා එම ගොඩනැගිල්ල විධිමත් පරිදි භාරදී නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත	වගකීම පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය

(ඊ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2)වගන්තිය ප්‍රකාරව එක් එක් අස්ථිත්‍යවල මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාද ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2024 වර්ෂය සඳහා අස්ථිත්වයන් 30 ක් වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	පළාත් සභාවේ ආයතන විසින් තම මූල්‍ය ප්‍රකාශන සෑම වර්ෂයකම පෙබරවාරි 28 දිනට විගණනය වෙත ඉදිරිපත් කර පසුව මැයි මාසයේ 31 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කරනු ලබයි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2)වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

1.5.26 ශීර්ෂය 661 - පළාත් භාණ්ඩාගාරය

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පළාත් පාලන ආයතන 27 කට අදාළව උසාවි දඩ ආදායම රු.227,811,612 ක් ද, වර්ෂය තුළ ලැබීම් රු.424,482,038 ක් ද වශයෙන් එකතු වටිනාකම රු.652,293,650 ක් පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතුව තිබුණද, එයින් සමාලෝචිත වර්ෂයේදී රු.269,942,530 ක් හෙවත් සියයට 41 ක් පමණක් ගෙවා තිබුණි. එහිදී පළාත් පාලන ආයතන 09 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී කිසිඳු මුදලක් පළාත් සභාව විසින් ගෙවා නොතිබුණි.	2024 වර්ෂයේ ඉදිරිපත් කළ සියලුම ඉල්ලීම් සඳහා උසාවි දඩ මුදල් නිදහස් කර ඇති අතර ඉල්ලීම් නොකළ ආයතන සඳහා ඉල්ලීම් නොකළ ප්‍රාදේශීය සභා වෙත ගෙවීම් කර නොමැත.	මෙම මුදල් කඩිනමින් නිදහස් කළ යුතුයි.
(ආ)	සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට පළාත් පාලන ආයතන 27 කට අදාළව ගෙවිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.19,542,031 ක් ද, වර්ෂය තුළ ලැබීම් රු.160,602,430 ක් ද වශයෙන් එකතු වටිනාකම රු.180,144,461 ක් පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතුව තිබුණද, එයින් රු.89,643,117 ක් හෙවත් සියයට 50 ක් පමණක් ගෙවා තිබුණි.	2024 වර්ෂයේ ඉදිරිපත් කළ සියලුම ඉල්ලීම් සඳහා උසාවි දඩ මුදල් නිදහස් කර ඇති අතර ඉල්ලීම් නොකළ ආයතන සඳහා ඉල්ලීම් නොකළ ප්‍රාදේශීය සභා වෙත ගෙවීම් කර නොමැත.	මෙම මුදල් කඩිනමින් නිදහස් කළ යුතුයි.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ දී ලද මුද්දර ගාස්තුවලින් කිසිඳු මුදලක් පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන 13 ක් සඳහා ගෙවා නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 27 ක් සඳහා එකතුව රු.90,501,344 ක මුදලක් තවදුරටත් නිදහස් කිරීමට පවතින අතර	2024 වර්ෂයේ ඉදිරිපත් කළ සියලුම ඉල්ලීම් සඳහා උසාවි දඩ මුදල් නිදහස් කර ඇති අතර ඉල්ලීම් නොකළ ආයතන සඳහා ඉල්ලීම් නොකළ ප්‍රාදේශීය සභා වෙත ගෙවීම් කර නොමැත.	මෙම මුදල් කඩිනමින් නිදහස් කළ යුතුයි.

	තමන්කඩුව ප්‍රාදේශීය සභාව ඇවර කර තිබුණද රු.394,687ක් වූ ගෙවිය යුතු ශේෂයක් පැවතුණි.		
(ඇ)	2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, උතුරු මැද පළාත් සභාවේ පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් පේෂ කර්මාන්ත කටයුතු අත්තිකාරම් ගිණුම සහ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා වඩු පාසල් කටයුතු අත්තිකාරම් ගිණුමට අදාළ 2024 මූල්‍ය ප්‍රකාශන 2025 වර්ෂයේ පෙබරවාරි 28 දිනට පසුව ඉදිරිපත් කර තිබුණි.	නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බවට අදාළ ආයතන ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇත.	නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුයි.

1.5.27 ශීර්ෂය 664 - පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
උතුරු මැද පළාතේ පාසැල් වල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 1,862 කට ආසන්න මුදලක් වියදම් කර තිබුණු නමුත් 2023 මැයි 19 දිනැති අංක 24/2023 දරන පාසැල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව පාසැල්, කළාප සහ පළාත් මට්ටම අනුව පෝෂණ වැඩසටහනේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා සකස් කර නොතිබුණු බව 2025 ජනවාරි 24 දින අනුරාධපුර කළාපයට අයත් මහ බුලංකුලම විද්‍යාලයේ පෝෂණ වැඩසටහන පිළිබඳ ව සිදුකළ අභ්‍යන්තර විගණන පරීක්ෂාවේදී අනාවරණය කර නොතිබුණි.	ඉදිරියේදී මෙම රැස්වීම් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුයි.

1.5.28 ශීර්ෂය 665 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේපළ පැවරුම් මත මුද්දර ගාස්තු අයකිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලවල ලියාපදිංචි ඔප්පු අතරින් 2024 දෙසැම්බර් 31 දින වන විට 2022 වර්ෂයේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාළව 2023 වර්ෂයෙ ලියාපදිංචි ඔප්පු පමණක් විමර්ශන කටයුතු අවසන් කර ගෙවා ඇති මුද්දර ගාස්තුවල නිවැරදිභාවය තහවුරු කරගෙන තිබුණි.	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කරන ඔප්පු ප්‍රමාණය වැඩි වීම මීට හේතු වී ඇති බව දන්වා තිබුණි.	ලියාපදිංචි ඔප්පු විමර්ශනය කර මුද්දර ගාස්තුවල නිවරදිතාවය තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පලිබෝධ නාශක පනත යටතේ ලියාපදිංචි වී තිබුණු රසායන ද්‍රව්‍ය අළෙවිසැල් 03 කින් හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි වී තිබුණු ඖෂධ අළෙවිසැල් 13 කින් එම ව්‍යාපාර පරිශ්‍රයන්හි වාර්ෂික වටිනාකම් මත අයකළ යුතු රසායන බද්ද හා ඖෂධ බදු සමාලෝචිත වර්ෂය තුළ දී අයකර නොතිබුණි.	රාසායන ද්‍රව්‍ය අලෙවිසැල් පහෙන් දෙකක බදු මුදල් දැනටමත් අයකර ඇත. ඖෂධ අලෙවිසැල් මඟින් බදු මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී	රසායන බද්ද හා ඖෂධ බද්ද නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කල යුතුයි.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 කට අදාළව අයවිය යුතු දීර්ඝ කාලීන ඉඩම් බලපත්‍ර ගාස්තුව රු.469,419,077 ක් වූ අතර, ඒ තුළ වසර 1-3ත් අතර අයවිය යුතු ශේෂය රු.159,664,553ක් ද, වසර 03 කට වඩා පැරණි ශේෂය රු.204,042,991 ක් ද විය.	හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කරන බව.	අය විය යුතු ඉඩම් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.

(ඇ)	2023 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද දේපළ පැවරුම්වලින් මුද්දර ගාස්තු අයකිරීම් පිළිබඳ නියැදි පරික්ෂාවේදී දේපළ තක්සේරු කරනු ලැබූ අවස්ථාවේ සාමාන්‍ය වෙළඳ පොළෙහි පැවතුණ පදනම් වටිනාකමෙහි (Base Value) අවම අගයට හෝ තක්සේරු නොකිරීම හේතුවෙන් ඉඩම් කට්ටි 08 ක වටිනාකම රු.23,880,000 ක් අඩුවෙන් තක්සේරු කිරීමක් නිසා රු.938,484 ක මුද්දර ගාස්තු ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු 2026 වසරේ සිට මෙම කාර්යය සඳහා සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බව.	ඉඩම්වල පදනම් වටිනාකම ගණනය කිරීමේදී ඒ සඳහා සුදුසු නිලධාරීන් යොදාගෙන නිවරදිව සිදුකළ යුතුය.